**අපගේ සේවාදායක, විසල් ශාඛා ජාලයක් සතු ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක, ශ්‍රී ලංකාවට සෞභාග්‍ය ළඟාකරවීමට උත්සුක වෙමින් සිටින සංවර්ධන බැංකුවයි. ඔවුන්, දේශයේ ආර්ථිකය නගා සිටුවීම සඳහා ධෛර්යය දෙමින් ආදායම් විෂමතා අවම කිරීම්, ග්‍රාමීය ව්‍යවසායකත්වය පෝෂණය කරමින් රැකියා අවස්ථා ජනනය කරයි. දැනට ඔවුන් බැංකුවේ අරමුණු කරා මෙහෙයවීම සඳහා විශිෂ්ඨ නායකත්ව හැකියාවකින් යුත් අවශ්‍ය සුදුසුකම් සහිත පළපුරුදු වෘත්තිකයකු සොයනු ලබයි.**

# සාමාන්‍යාධිකාරී / ප්‍රධාන විධායක නිලධාරී

**ප්‍රධාන අවශ්‍යතා**

➢ පහත සඳහන් සුදුසුකම් අතුරින් අවම එක් සුදුසුකමක් ලබා තිබීම.

(අ) පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් උපාධියක් සමග අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි සුදුසුකමක්

හෝ

(ආ) බැංකු හෝ වෙනත් අදාළ ක්ෂේත්‍රයක වෘත්තිය සුදුසුකම් ලබා තිබිය යුතුය.

➢ වසර 10ක ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ පළපුරුද්ද ලබා තිබිය යුතු අතර, ඉන් වසර 05ක් බැංකුකරණය පිළිබඳ පළපුරුද්ද සහිත වීම විශේෂ වේ.

➢ සංවර්ධන බැංකුකරණය, බැංකු මෙහෙයුම් කටයුතු, ණය අවදානම් කළමනාකරණය, බැංකු ව්‍යාපාර කටයුතු පිළිබඳ මූල්‍ය හා අලෙවිකරණ හැකියාවන් ලබා තිබීම වාසිදායක වනු ඇත.

➢ පහළ ස්ථරවල ව්‍යවසායකත්ව ක්‍රියාවලියේ නිරත ප්‍රජාවන් ශක්තිමත් කිරීමට ඇති දැඩි කැපවීම

➢ විශිෂ්ඨ මානව සම්පත් කළමනාකරණ හා නායකත්ව කුසලතා සහිත විය යුතුය.

➢ වයස අවුරුදු 56ට වඩා අඩුවීම.

**වැටුප් පරිමාව**

තෝරාගන්නා ලද අයදුම්කරු බැංකු ක්ෂේත්‍රයේ පවත්නා සම්මත, ආකර්ෂණීය දීමනාවන් සහිත වැටුපකට හිමිකම් කියනු ලබයි.

ඉහත සඳහන් කරන ලද, සුදුසුකම් සපුරාලීමට අසමත් වන හෝ වැරදි තොරතුරු ඇතුළත් අයදුම්පත් මෙම බඳවා ගැනීමේ ක්‍රියාවලියේ ඕනෑම අවස්ථාවකදී කිසිදු පූර්ව දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. තෝරාගත් අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවීමේ සහ මෙම බඳවා ගැනීම කල් තැබීම හෝ අවලංගු කිරීමේ අයිතිය සේවාදායක සතුය.

කරුණාකර ඔබගේ සම්පූර්ණ කරන ලද ජීවදත්ත, PDF ආකෘතියෙන් ඥාති නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ ඇමතුම් විස්තර සමග මෙම දැන්වීම පළවී දින 10ක් තුළ **mslrcv@sltnet.lk** වෙත ඉදිරිපත් කළ යුතු අතර, අදාළ විෂය තීරයේ **MSL යොමු අංකය 8089** ලෙසට සඳහන් කළ යුතුයි.

MSL Management Systems (Pvt) Ltd.

**අංක 80, ටිකල් පාර,**
**කොළඹ 08.**
**0112-015900**